අල්ලස දූෂණය සමග ඇදෙන බිඳුණු කවුළු ආර්ථිකය

ජනපති රාජපක්ෂ යටතේ මෙහෙයවනු ලැබූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව, ජනතා ශුභ සාධනයට හානි කරමින් සිදු කළා යයි සිතන අති විශාල දූෂණ සහ වංචාවලට එරෙහි වන බවට සිරිසේනගේ ජනපතීත්වයත්, එය උත්කර්ෂයට නැංවූ  එක්සත් ජාතික පක්ෂයත් ජනාධිපතිවරණය පුරාවට සහතික විය. නව ජනාධිපතිවරයාගේ ධුරකාලයේ මාස දෙකක් අවසන්වන අවස්ථාවේ සළකා බැලිය යුතු කරුණු දෙකක් මතුකර ඇත. එනම්, (1) දූෂණයට එරෙහිව කටයුතු කිරීම  මන්දගාමිය (2) තෝරුන් මෝරුන් සිටියදී, හාල් මැස්සන්ට එරෙහිව ක්‍රියා කිරීම වලංගු නැත. මෙම ලිපිය මගින්, දෙවැනි කරුණ සම්බන්ධව මෙන්ම දූෂණයට එරෙහි වීමේ ආර්ථික වැදගත්කම සම්බන්ධවද  ආර්ථික විද්‍යාත්මක ඇසකින් විග්‍රහයක් සම්පාදනය කරනු ලබයි.

රාජපක්ෂ කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරයෙක් සහ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කැපී පෙනෙන සාමාජිකයෙකුගේ බිරිඳට එරෙහිව එල්ල කරනලද චෝදනා සමග 'සුළු නීති උල්ලංගනය කිරීම්' නොසලකා හරින ලෙස රජයට කරනලද ඉල්ලීම් මෑත කාලීනව කැපී පෙනෙන ලෙස අවධානයට යොමු විය. විශ්ලේෂණය පෞද්ගලික එකක නොවන හෙයින් ඇය A ලෙස නම් කරමු. A ට එරෙහිව නැගුනු චෝදනවා වූයේ, සාවද්‍ය උපන්දිනයක් යොදා රාජ්‍ය තාන්ත්‍රික ගුවන් ගමන් බලපත්‍රයක් ලබා ගැනීමයි. රටේ කැපී පෙනෙන පුද්ගලයින් ඇය ආරක්ෂා කරමින් කතා කරන ලදි. එසේ කිරීමේදී ඔවුන්ගේ ප්‍රධාන තර්කය ලෙස පෙනී ගියේ 'සුළු නීති උල්ලංගනය කිරීම්' වලට එරෙහිව ක්‍රියා කිරීම එතරම් වලංගු නොවන බවයි.

බිඳුණු කවුළු පාලන න්‍යාය (Theory of Broken Window Policing)

'සුළු නීති උල්ලංගනය කිරීම්' නොසලකා හැරීමෙන් ඒවා විශාල ගැටළු බවට පත් විය හැකි ආකාරය කෙරෙහි  නීතිය ක්‍රියත්මක කිරීම පිළිබඳ මෙම න්‍යාය මූලික වශයෙන් අවධානය යොමු  කරයි. මෙවැනි 'සුළු' ඒවා  අවසාන වන්නේ මර්දනය කිරීමට අපහසු සහ වියදම් අධික විශාල අපරාද වශයෙනි. යන එන අතරමග ගලකින් ගසා ජනෙල් වීදුරුවක් බිඳීම හෝ කුරුටු ගී විනාශ කිරීම වැනි සුළු අපරාධ  වලට එරෙහිව පොලිස් නිලධාරින් කටයුතු කිරීම මගින්, විශාල අපරාධ සඳහා ඇති ඉඩ ප්‍රස්තා අවහිර කරනු ලබයි. සුළු අපරාධවලට එරෙහිව සටන් නොකිරීමෙන් පෙනී යන්නේ පවතින ක්‍රමය සුපරික්ෂාකාරී නොවන බව හෝ ප්‍රමාණවත් තරම් අවධානයක් යොමු නොකරන බවයි. සමාජයීය විද්‍යාඥයින් විසින් සිදුකරන ලද ආනුභූතික පර්යේෂණ සහ සැබෑ ලෝකයේ නිදසුන් මගින් මෙම න්‍යාය ශක්තිමත් වී ඇත.

2015 වර්ෂයේ ජනවාරි මස, 'ද ඉකොනොමිස්ට්' (The Economist) සඟරාවට අනුව; 'තැපැල් පෙට්ටිය මතුපිට කුරුටු ගා ඇත්නම්, එහි එල්ලී තිබෙන ලියුම් කවරයකින් මුදල් සොරකම් කිරීමට ඇති භාව්‍යතාව

දෙගුණයකි. වෙනත් දෑ අතර, 1993 වර්ෂයේදී 100 000 කට 26.5 ක් වූ නිව් යෝර්ක් නගරයේ මිනීමැරුම් අනුපාතය 2013 වර්ෂයේදී 100 000 කට 3.3 ක් දක්වා පහත දැමීමට සුලු දෑ නියපොත්තෙන් කැඩීමේ න්‍යාය සහය විය.

බිඳුණු කවුළු න්‍යාය වත්මන් ශ්‍රී ලංකාවේ දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා යොදා ගත හැකි ආකාරය මෙම විශ්ලේෂණය මගින් පෙන්වා ලැබේ. මේ අතරතුර, දූෂණය පැතිරෙන්නේ කෙසේද සහ දූෂණයේ වාසි පිළිබඳ පවතින දුරවබෝධය පිළිබඳ කටයුතු කළ හැකිය.

**දූෂණය පිළිකාවක් ලෙස පැතිර යා හැකිය**

දූෂණයට ඇති සරල සහ සම්පූර්ණ නිර්වචනය වන්නේ, 'තමන්ට පවරා ඇති බලය පෞද්ගලික වාසි උදෙසා අයතා ලෙස භාවිත කිරීම' යන්නයි. අපරාධ හා සම්බන්ධ සොයා ගැනීම් අනුව, අල්ලස සහ දූෂණයත් බෝවන රෝග වැනිය. බරපතල ප්‍රතිපල සහිත පිළිකා ශෛලයක් ලෙස එය පැතිර යා හැකිය. එල්. ටී. ටී. ඊ. සංවිධානය සමඟ යුද්ධය පැවතුනු සමයේදී, වඩාත් අවධානම සහිත පුද්ගලයින් කිහිප දෙනෙකුට රථ පෙරහරක් ලබා දෙනු ලැබූ අතර, ඒ හරහා මාර්ගය භාවිත කරන අනෙකුත් පුද්ගලයින් පසෙකට තල්ලුකර දමමින් රථවාහන නීති නොතකා හරින ලදි . කෙසේවෙතත්, යුද්ධය අවසනා වීම නොතකා 2014 වර්ෂය වන විටත් මෙම භාවිතය සමාජය පුරා පැතිර පැවතුණිඃ දුසිම් ගණන් ඇමතිවරු සහ ආරක්ෂක ප්‍රධානින් මෙය සිදු කරන ලදි.

ඓතිහාසිකව, ශ්‍රී ලංකා නිල බල තන්ත්‍රය තුළ අල්ලස සහ දූෂණය සාමාන්‍යයෙන් ආරම්භ වුයේ 'හාල් මැස්සන්ගෙනි': ඒ ලේඛන කටයුතු ඉටුකර දීම සඳහා ලිපිකරුවන් සහ කනිෂ්ට ගිණුම් තබන්නන් රහසිගත ලෙස ජනයාගෙන් මුදල් ලබා ගැනීමයි. නමුත් කාලයත් සමඟ, අනෙකුත් අයත් මෙම තත්ත්වයට හුරු වූ අතර, 'කුට්ටිය' විශාල විය. සුළු අපරාධ නොතකා හැරීම, පිළිකාවක් ලෙසම, මැඩපැවැත්විය නොහැකි තත්ත්වයක් බවට පත් වනු ඇත.

ඉතා හොඳින් ක්‍රියාත්මකවන ආර්ථිකයක් තුළ, පෞද්ගලික අංශයේ ලාබ ලැබීමේ අභිප්‍රාය විසින්, ආර්ථික වර්ධනයේ සහ සාර්ථකත්වයේ උත්පාදකය වන පර්යේෂණ සහ නව නිපැයුම් සඳහා ශක්තිමත් දිරි දීමක් නිර්මාණය කරනු ලබයි. ඉතා සුළු යයි සලකනු ලබන දූෂිත තත්වයන්ගේ වුවත් වඩාත් ඍනාත්මක ප්‍රතිපල වන්නේ, පෞද්ගලික අංශය පර්යේෂණ සහ නව නිපැයුම් හරහා ලාභ ලබා ඉපයීම උදෙසා ලබා දෙන දිරි-දීම් වලින් ඉවත්ව දූෂිත අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගෙන ඒ හරහා ලාභ ඉපයීමට යොමු වීමයි.

පර්යේෂණ සහ නව නිපැයුම් දුර්වල වීමේ ප්‍රතිපලයක් ලෙස ආර්ථිකය අදිසි ලෙස බලපෑම් ලබයි. උදාහරණයක් ලෙස, ලෝකයේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා දල දේශීය නිෂ්පාදනයෙන් අවම ප්‍රතිශතයක් වියදම් කරන්නේ දකුණු ආසියාවයි. ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපයේ පවා පසුවන්නේ අවම මට්ටමකයි.

ප්‍රබල පෞද්ගලික ආයතන සහ භාණ්ඩාගාරයේ හිටපු ලේකම් දක්වා දිවයන රාජ්‍ය නිල තන්ත්‍රය සම්බන්ධවී සිදුකරන ලද දූෂණ විශාල ප්‍රමාණයක් අනාවරණයකළ 2008 සහ 2009 වර්ෂවල ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දු මගින් පෙනී යන්නේ දූෂණය පිලිකාවක් ලෙස මුළු පද්ධතිය පුරාම පැතිර යා හැකි බවයි. දූෂිත දේශපාලකයින් සමඟ සම්බන්ධවී ලාභය සුරක්ෂිත කරන වෙළඳ ක්‍රියා පිළිවෙත මගින්, පර්යේෂණ සඳහා ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය දක්වන දුර්වල උනන්දුව පැහැදිළි කරයි.

**දූෂණ වංචා ආර්ථිකයට හිනිමං බැඳීමක්ද නැතහොත් වල කැපීමක්ද?**

හිනිමං බැඳීම

සිංගප්පූරුවේ සාර්ථකත්වය පිළිබඳ කතාන්දරය, අධිකාරීත්ව ආණ්ඩුවක් සාධාරණීකරණය කිරීම සඳහා ඉතාම නරක ලෙස යොදා ගන්නා ලද ආකාරයටම 'කාර්යක්ෂම හිනි මග' උපන්‍යාසයත් දුරවබෝධ සහ දුර්භාවිත වෙයි. මෙහි අදහස වන්නේ, අඩු වැටුප් ලබන අලස රාජ්‍ය නිලධාරින් අභිප්‍රේරණය කිරීමටත් ඔවුන්ගේ කාර්ය සාධනය වැඩි කිරීමටත් මෙම අල්ලස් මගින් හැකිවන අතර ඒ තුළ යම් මුදලකට ජනතාවට සේවය සැපයීම තුළ දෙපාර්ශවයම තෘප්තිමත් බවයි. මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව හොඳ උදාහරණයකි. ආර්ථිකය දුර්වල සහ රාජ්‍ය පරිපාලනය කඩා වැටුණු රටකට මෙම උපකල්පනය වලංගු වෙයි. නමුත් කිසිදු සංවර්ධිත රටක් මෙම උපන්‍යාසය මත ක්‍රියාත්මක නොවේ.

ආර්ථිකයට වල කැපීම

නමුත් ආර්ථිකය වර්ධනය වන විට වඩාත් වලංගු උපන්‍යාසය වන්නේ දූෂණය මගින් ආර්ථිකයට හිනිමං බඳිනවාට වඩා එයට බාධා කරන බවයි. අල්ලස සහ දූෂණයට ඇති අවස්ථා සාමාන්‍යකරණය වූ විට ඒ හරහා මතුවන වාසිසහගත තත්ත්වය දකින නිලධාරින්, තම අභිමතයට විසඳිය හැකි ප්‍රශ්න නිර්මාණය වන පරිදි නිරන්තරවම ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ප්‍රති සැලසුම්ගත කරන අතර ඒ තුළ අල්ලස-දූෂණය සඳහා ඇති අවස්ථා සහ අවකාශ වර්ධනය වෙයි. උදාහරණ ලෙස, පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ මහා බැංකුවේ සහ මුදල් අමාත්‍යංශයේ ඉහල නිලධාරීන්ගේ නිරන්තර මන්තරය වූයේ 'අපේ ප්‍රතිපත්ති නිසා ඇතිවිය ප්‍රශ්න ගැන කරදර නොවන්න. ඔබ නියම ආයෝජකයෙක් නම් අපට සම විටම ඔබ වෙනුවෙන් විකල්පයක් දිය හැකියි. අප වෙත පැමිණ කතා කරන්න' යන්නයි. අල්ලස සහ දූෂණය ආර්ථිකයට බාධා කරන්නේය යන්නට තවත් ප්‍රබල උදාහරණයක් වන්නේ, රේගු දෙපාර්තමේන්තුවට විද්‍යුත් ලේඛන ගබඩාවක් හඳුන්වා දීමට වෙළඳ ප්‍රජාව සහ අනෙකුත් රාජ්‍ය ආයතන දරන්නා වූ දීර්ඝ කාලීන වෑයමයි. මෙය ශ්‍රී ලංකාව වෙළඳ පහසුකම් සැපයීමේ තරගකාරිත්වය තුළ හෝ පාලන මධ්‍යස්ථානයක් ලෙස සාර්ථක කරගැනීම යන කරුණු දෙකටම තීරක සාධකයක් වෙයි. විද්‍යුත් ලේඛන ගබඩාවක් හඳුන්වා දීම මගින්, පිළියෙළ කිරීම් වේගවත් කරන අතර, කාර්ය කොටස අඩුකිරීමත්, ලේඛනගත කිරීම් කාර්යක්ෂම කිරීමත්, කාලය පිරිමසා ගැනීමත් සිදුවන අතර ප්‍රතිපලය වන්නේ

සියලු පාර්ශවයන් තුළ  මහත් කාර්යක්ෂමතාවක් ඇති වීමයි. නමුත් එමගින් රේගු දෙපාර්තමේන්තුවේ ව්‍යාප්තව පවතින සහ පුරෝකථනය කළහැකි අල්ලස සහ දූෂණය යටපත් වෙයි. විද්‍යුත් ලේඛන ගබඩාවක් හඳුන්වා දීමේ රේගු දෙපාර්තමේන්තු ප්‍රයත්නය දශක දෙකක් තිස්සේ යම් තෝරාගත් කර්මාන්තවලට පමණක් සීමාවී  ක්‍රියාත්මක වෙයි.

අල්ලස-දූෂණයට එරෙහිව බිඳුණු කවුළු පාලන න්‍යාය

බිඳුණු කවුළු පාලන න්‍යාය අල්ලස-දූෂණයට එරෙහිව සටන් කිරීමට යෝග්‍ය වෙයි. නිව් යෝර්ක් නගරය මෙම න්‍යාය අනුගමනය කරමින් ප්‍රථමයෙන්  තෝරුන් මෝරුන් ඇල්ලීමට බලා නොසිට හාල්මැස්සන් පසු පස හඹා ගිය අතර, එය සාර්ථක විය. මේ ලිපිය ආරම්භයේ සඳහන්කළ පරිදි  A ගේ සිද්දිය සම්බන්ධව රජයේ ක්‍රියා පිළිවෙත විවේචනය කරමින් ගොඩ නැගූ තර්කය මගින් අල්ලස දූෂණය සම්බන්ධ ශ්‍රී ලංකාවේ කාලින ගැටලුව පෙන්වනු ලබයි.

ජනප්‍රිය ලේඛකයෙකු සහ උපකාරක පන්ති ගුරුවරයෙකු වන උපුල් ශාන්ත සන්නස්ගල ප්‍රබල ලෙස A ආරක්ෂා කරන ලදි. A ට එරෙහි චෝදනා වලංගු නොවන බව ඔහුගේ ප්‍රධාන තර්කයයි. කෙටියෙන් කියතහොත්, බිඳුණු කවුළුව ඒ අයුරින්ම තිබෙන්නට හැරිය යුතුය. එම තර්කය සනාත කිරීමට ඔහු දරන වෑයම මගින් එම තර්කය වැරදි වන්නේ ඇයිද යන්න පෙන්වා දෙයි.

මාධ්‍යයේ පළවූ ආකාරයට, සන්නස්ගල A ආරක්ෂා කිරීමට ගෙන එන තර්කය වන්නේ, 'බොහෝ පුද්ගලයින් සාවද්‍ය ලේඛන සකසයි' යන්නයි. ඔහු සපයන ප්‍රධාන උදාහරණය වන්නේ, රාජකීය විද්‍යාලය වැනි ජනප්‍රිය පාසල් වලට ඇතුළු වීම සඳහා පුද්ගලයින් සාවද්‍ය ලේඛන සකසන බවයි. ඔහු ප්‍රකාශ කරන්නේ, ඔහුත් තම පුතුන් දෙදෙනා රාජකීය විද්‍යාලයට ඇතුළු කිරීම සඳහා (ඔවුන්ට ඇතුළු වීමේ අවස්තාව නොලැබුනත්) මෙවැනි ව්‍යාජ ලේඛන සකස්කළ බවයි.  A විසින් රාජ්‍ය තාන්ත්‍රික ගුවන් ගමන් බලපත්‍රයක් සකස් කිරීම සඳහා සාවද්‍ය උප්පැන්න සහතිකයක් සම්පාදනය කිරීම සහ පාසල්වලට ඇතුළු වීම සඳහා පුද්ගලයින් විසින් ව්‍යාජ ලිපින ලබා දීම සන්නස්ගල විසින් රළු ලෙස සමාන කිරීම  මගින් අවබෝධ වන්නේ බිඳුණු කවුළු න්‍යාය හරහා පෙන්වා දෙනු ලැබූ සුළු පරිමාන වංචා දූෂණ මහා පරිමාණ ඒවා බවට පත් වීමේ අවධානමෙහි ආරම්භය මෙය බවත්, සුළු පරිමාණ නීති කඩකිරීම් හඹා යාමේ වැදගත්කමත්ය.

A රැක ගැනීම උදෙසා පෙනී සිටින පුවත් පත් පෙන්වා දෙනු ලබන්නේ පූර්ව රජය යටතේ පුද්ගලයින් 2000 ක පමණ ප්‍රමාණයක් මෙවැනි රාජ්‍ය තාන්ත්‍රික ගුවන් ගමන් බලපත්‍ර ලබා ගෙන තිබෙන බවයි. මෙම රාජ්‍ය තාන්ත්‍රික ගුවන් ගමන් බලපත්‍ර මගින් මෙම පුද්ගලයින්ට යම් යම් වාසි අත්කර දෙනු ලබයි. එයින් වැදගත්ම එක වන්නේ, රාජ්‍ය තාන්ත්‍රික ගුවන් ගමන් බලපත්‍ර ධාරියාට ඔවුන්ගේ ගමන් මලු ආරක්ෂක සහ රේගු පරික්ෂාවන්ගෙන් නිදහස් කරගත හැකි වීමයි. ඒ අනුව රාජ්‍ය තාන්ත්‍රික ගුවන් ගමන් බලපත්‍ර නිකුත් කිරීමේදී සිදුවන අක්‍රමිකතා හරහා මත් කුඩු සහ මැණික් හොර ජාවාරම වැනි

විශාල ගැටළු මතු විය හැකි අතර වර්තමානයේදී ඉතාම නිවැරදි ලෙස එවැනි කරුණු පිළිබඳ ගවේෂණ සිදු කරනු ලබයි.

මහජනයාට සහ රජයට උගත හැකි පාඩම්

2005 වර්ෂයේ ජාත්‍යන්තර ක්ෂමා (Transparency International) සංවිධානය විසින් නිකුත් කරනලද ගෝලීය අල්ලස් දූෂණ සුචියෙහි (Global Corruption Index) 78 වන ස්ථානය ශ්‍රී ලංකාවට හිමිව තිබූ අතර 2005 වර්ෂයේදී එය 85 වන ස්ථානය දක්වා පහත වැටුණි. දීර්ඝ කාලයක් තිස්සේ පවතින සාක්ෂි මගින් පෙන්වා දෙනු ලබන්නේ වර්ධනය වන අල්ලස සහ දූෂණය හමුවේ ආර්ථික සංවර්ධනය ස්ථිරසාර නොවන බවයි. ලෝකයේ ආර්ථික පද්ධති තුළ ඉහළ දළ දේශීය ආදායමත් පහළ මට්ටමක පවතින අල්ලස සහ දූෂණයත් අතර ප්‍රබල සහ සම්බන්ධතාවක් ඇත.

A ට එරෙහි ක්‍රියා මාර්ගය ජනතාව විසින් ප්‍රශ්න කිරීමෙන් පෙනී යන්නේ නොමඩින ලද අල්ලස සහ දූෂණය දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකා සමාජයට කා වැදී ඇති බවයි. 1993 වර්ෂයේ නිව් යෝර්ක් නගරය තුළ මෙන්ම ගැටලුව විශාල වන අතර එමගින් සමාජය විශාල ලෙස බලපෑමට ලක්ව ඇත. බිඳුණු කවුළු න්‍යාය මගින් යෝජනා කරන්නේ, මර්දන ක්‍රියාකාරකම් සෑම අදියරකින්ම ආරම්භකළ යුතු අතර විශේෂයෙන්ම පළමු අදියරවලදී නියත වශයෙන්ම එසේ සිදු විය යුතු බවයි. තෝරුන් සහ මෝරුන් ආරක්ෂා කරමින් හාල් මැස්සන්ට චෝදනා කළහොත් ගැටලුවක් ඇති විය හැකිය. එහෙත් එවිට විවේචනය කළ යුත්තේ තෝරුන් මෝරුන් ආරක්ෂා කිරීම සහ එසේ කරන පාලන ක්‍රමයේ පවතින දූෂිත තත්ත්වයයි. එහෙත්, දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා අවංක ප්‍රයත්නයක් දැරීමේදී හාල්මස්සන්ට පසු පස හඹා යාමට අවශ්‍ය තරම් හේතු ඇත - දූෂණය සමඟ සටන් කිරීමට බිඳුණු කවුළු න්‍යායේ අදාලත්වය එයයි.

වෙරිටේ පර්යේෂණ ආයතනය, ආසියාව තුල රාජ්‍ය සහ පෞද්ගලික අංශයට උපක්‍රමික විශ්ලේෂණ සම්පාදනය කරනු ලබයි. ඔබගේ අදහස් [insight@veriteresearch.org](mailto:insight@veriteresearch.org) යන අපගේ විද්‍යුත් ලිපිනයට යොමුකරන්න.